# පේරාදෙණිය

## රාජකීය උද්භිද උද්‍යානය



යූ.පී.එස්. පතිරණ

**අද ශ්‍රී ලංකාවේ විශාලතම උද්භිද උද්‍යානය වනුයේ පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයයි. 19 වන සියවසේ මුල් භාගයේදී එනම්, 1821 දී ආරම්භ කෙරුණු මෙම උද්‍යානය අද අක්කර 147ක පමණ භූමි භාගයක් වසා පැතිර පවතී. මෙය කෝපි හා කුරුඳු වගාවෙන් ආරම්භ කෙරුණ ද පසුව විවිධ මාදිලියේ වෘක්ෂලතාදිය වෙනුවෙන් වෙන් කෙරිණ.**

මුහුදු මට්ටමේ සිට අඩි 1550 ක උසකින් මහවැලි ගඟ අසබඩ පිහිටි මෙම උද්භිද උද්‍යානය පිහිටියේ කොළඹ - නුවර ප්‍රධාන මාර්ගයේ මහනුවරට සැතපුම් හතරක් පමණ මොබ්බෙනි. පේරාදෙණි සරසවි උයන දුම්රිය ස්ථානයේ සිට මෙම උද්‍යානය වෙත ඇත්තේ ඇවිදයන තරමේ කෙටි දුරකි. නිරිතදිග මෝසම් සුළඟින් වර්ෂාව ලබන මෙම උද්‍යානයට අඟල් 90 ක පමණ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනයක් ලැබේ. මෙහි සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 25 ක් පමණ වේ.

පේරාදෙණිය උද්‍යානයේ ඉතිහාසය ගම්පොල රාජධානිය සමය තෙක් නැතහොත් 1371 තෙක් දිවේ. වත්මන් උද්‍යාන අධිකාරි බංගලාව අසල හමුවී ඇති පැරණි ගොඩනැගිලි හා පුරාවිද්‍යා ස්මාරක අනුව III වන වික්‍රමබාහු රජු විසින් මහවැලි ගඟ අසබඩ මෙහි රජමාලිගාවක් පවත්වාගෙන ගිය බවට දෙස් දේ.

පසුව එනම් ක්‍රි: ව: 1747 - 1780 කාලය තුළ මහනුවර රාජ්‍යත්වයට පත් කීර්ති රාජසිංහ විසින් මෙය රාජකීය උද්‍යානයක් බවට පත්කර ඇති අතර, පසුව රාජාධිරාජසිංහ රජතුමා විසින් (1780 - 1798) මෙහි තාවකාලික මාලිගයක් තනා වැඩ විසූ බව ද කියැ වේ.

මෙහි විමලධර්මසූරිය රජතුමා විසින් ඉදිකරන ලදුව, රාජාධිරාජසිංහ රජතුමා විසින් සංවර්ධනය කරන ලද විහාරයක් හා දාගැබක් ද වූ අතර, එය 1803 දී මහනුවර පැමිණි ඉංග්‍රීසීන් විසින් විනාශකර ඇත. දෙවන රාජසිංහ රජතුමා හා පෘතුගීසීන් සමග ඇතිවූ ප්‍රකට ගන්නෝරුව සටන සිදුවූයේ ද මෙහි මහවැලි ගඟෙන් ඔබ්බෙහි පිහිටි භූමියෙහි ය. 1821 දී මෙහි ප්‍රථම උද්‍යාන පාලක ඇලෙක්සැන්ඩර් මූන් විසින් පේරාදෙණිය උද්‍යානය භාරකාරත්වයට ගන්නා විට මෙහි භික්ෂූන් වහන්සේ නමක් ද වැඩසිටි බවට ප්‍රධාන දෙරටුවට නුදුරින් ඇති ගොඩනැගිල්ලක නෂ්ඨාවශේෂ සනාථ කරයි.


ලංකාවේ ප්‍රථම උද්භිද උද්‍යානය ලංදේසීන් විසින් ආරම්භ කරන ලද්දේ කොළඹ කොම්පඤ්ඤවීදියේ ය. කෙසේ වුවද, පසුව ඉංග්‍රීසීන් විසින් එය අත්හරින ලදුව, ඉඩම ද විකුණා දමන ලදී. නැවත 1810 දී ශ්‍රීමත් ජෝෂප් බැන්ක්සේගේ උපදෙස් මත කොම්පඤ්ඤවීදියේ කිව් නමින් උද්‍යානයක් ආරම්භකරන ලදී.

එහි අධිකාරි වශයෙන් විලියම් කර් පත් කෙරිණ. 1814 දී කර් මියයාමත් සමඟ ඔහුගේ අනුප්‍රාප්තිකයා වශයෙන් ඇලෙක්සැන්ඩර් මූන් පත්වූ අතර, 1821 දී එම උද්‍යානය වඩාත් සුදුසු පරිසරයක් සහිත පේරාදෙණියට මාරුකරන ලදී.











ඒ අනුව, පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ප්‍රථම උද්‍යාන පාලක බවට පත්වූයේ ඇලෙක්සැන්ඩර් මූන් ය. දෙවන ලෝක සංග්‍රාමයේ මිත්‍ර හමුදාවල දකුණු ආසියානු අණදෙන මූලස්ථානය භාරව සිටි මවුන්ට් බැටින් සාමිවරයා ස්ථානගතව සිටියේ ද පේරාදෙණිය උද්භිද උද්‍යානය තුළ ය.

සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙ. අංශක 25 ක් වන මෙම උද්‍යානයට නිරිත-දිග මෝසම් සුළඟින් වැඩි වර්ෂාපතනයක් ලැබේ.

මෙහි වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය අඟල් 90 ක් පමණ වේ. මේ නිසා විවිධ වර්ගයේ වෘක්ෂලතාදිය වැඩීමට මනා පරිසරයක් සලසාදී තිබේ. උද්‍යානයට ප්‍රවේශවන ප්‍රධාන ගේට්ටුවේ සිට දකුණුපස පේළිය මල්පිපෙන ශාකවල රැජින ලෙස හැඳින්වෙන ඇම්බර්ස්ටියා නොබිලිස් (Amberstia nobilis) ගස් වලින් සැරසී ඇත. එල්ලුන ලස්සන රෝස පාට හා කහපාට මලින් සැරසුණු එම මල්බර ගස් බුරුමය හා මැලක්කාව මුල්බිම් කරගත් ඒවා වෙති. ගේට්ටුව දෙපස මැඩගස්කරයේ සිට ගෙනවුත් 1841 දී ලංකාවට හඳුන්වාදෙනු ලැබූ Delonix regia නම් ගිනිසිළු වැනි ගස් දෙක ද වැදගත් ආකර්ෂණයකි.

මෙම උද්‍යානය තුළ විවිධ වර්ගයේ ශාක රැසක් දැකබලා ගත හැකි අතර, බොහොමයක් කහ, රතු, කොළ හා කළු යන පාටවලින් යුතු ලේබල් හතරක් මගින් වර්ගීකරණයකට ද ලක්කර තිබේ. ඒ අනුව, කහපාට ලේබල්වලින් නම් යොද ඇති ශාක විෂ සහිත ශාක ලෙසත්, රතුපාටින් යෙදූ ලේබල් සහිත ශාක ඒක දේශීය (මෙරටට ආවේනික) ශාක ලෙසත්, කොළපාටින් ලේබල් යෙදූ ශාක දේශීය ශාක ලෙසත් කළු පාට ලේබල් සහිත ශාක විදෙස්වලින් මෙරටට හඳුන්වා දුන් ශාක ලෙසත් සැලකේ.

උද්‍යානය තුළට ඇතුළු වී වම්පසට දිවෙන ලේක් ඩ්‍රයිව් මග ඔස්සේ ඉදිරියට ඇදෙන විට දකුණුපස දක්නට ලැබෙන එල්ලෙමින් පවතින දිගු අතු සහිත මෙලලෙවූකා මිනර් යන උද්භිද නාමයෙන් හැඳින්වෙන ගසකි. එම ගස පිටුපසින් ජාවාවේ වැවෙන උපාස් නමැති ශාකය තද විෂ සහිත ශාකයකි. එය හඳුන්වා දීම සඳහා කහපාට ලේබලය යොද ඇත. ජාවාවේ ගෝත්‍රිකයන් සතුන් දඩයම් කිරීම සඳහා මෙම ශාකයෙන් ඊතල සකසා ගත් බව පැවසේ.

ඒ අසලම වාගේ නැපෝලියන්ගේ හිස් වැස්මට සමාන කෙරෙත මල් සහිත (Napoleona imperialis) නමැති මල්ගස් හා බුරුමයේ අභිමානය (Pride of Burma) වැනි ගස් ද මුලින්ම සංචාරකයන්ගේ නෙත සිත බැඳ තබයි. එතැන් සිට ශ්‍රී ලංකාවේ හැඩයට සකසා ඇති ඕලු, මානෙල් හා පත් පිරි විල දෙසට ගමන් ගනිද්දී දකුණු පසින් මදුරා ගස් දැකගත හැකිය. පැරණි කාලයේ මිනිසුන් වන සතුන්ගෙන් හා සර්පයන්ගෙන් ආරක්ෂා වීමට මෙම ශාකයේ ලී කැබැල්ලක් රැගෙන ගිය බව ද කියැවේ.

ඊට මදක් ඔබ්බෙන් මලයාවේ හා දකුණු ඉන්දියාවේ දේශීය ගසක් වන කොචින් ගොරකා ගස් දෙකකි.

ඉන් දකුණට ඇත්තේ (Dendrocalamus giganteus) නමැති උද්භිද නාමයෙන් හැඳින්වෙන යෝධ බුරුම උණගස් යායයි. එහි අග්ගිස්ස අඩි 90 සිට 130 දක්වා උස්ව වැඩී ඇති අතර, අඟල් 10 ක පමණ පරිමාවකින් යුක්ත ය.

ශ්‍රී ලංකාවට පැමිණි විවිධ විදේශ රාජ්‍ය නායකයන් විසින් රෝපණය කරන ලද පැළැටි ඇතුළත් කලාපය තුළ VII එඩ්වඩ් රජ විසින් 1875 දී රෝපණය කළ ප්‍රථම පැළැටිය සමග එලිසබෙත් මහ රැජින විසින් 1954 වර්ෂයේ රෝපණය කරන ලද ගස ද, රුසියානු ගගනගාමී යූරි ගගාරින් විසින් රෝපණය කරන ලද ගස ද ආදී වශයෙන් සම්භාවනීය විදේශීය අමුත්තන් රැසක් විසින් රෝපණය කරන ලද ශාක රැසක් දැකබලාගත හැකි ය.

දැනට ලෝකයේ ඉතිරිව පවතින එකම ශාකය ලෙස සැලකෙන කළුකෙන්ද ගස ද විශේෂ සංචාරක ආකර්ෂණයෙකි. කැප්ටන් කුක්නමින් නම්කර ඇති කුක් ෆයින් ඇවනිව් දෙපස ඇලවී ඇති ෆයින් ගස් පේළිය ද පසුකර උද්‍යානයේ මධ්‍යයට පැමිණිවිට විශාල තණ බිමේ මැද ඇති වර්ග මීටර් 2420 ක පෙදෙසක් වසා අතු පතර වීහිදගත් යෝධ ඇසතු ගස උද්‍යානයට වැඩි ආකර්ෂණීය බවක් ලබා දී තිබේ.

උද්‍යානය තුළට ඇදී එන සංචාරකයන් නැරඹීමට අමතක කරනු නොලබන තවත් වැදගත් තැනක් වනුයේ උඩවැඩියා නිවසයි. එම උඩවැඩියා නිවස තුළ උඩවැඩියා වර්ග 184 ක් පමණ දක්නට ලැබෙන අතර, ඉන් 25 ක් ම මෙරටට ආවේනික උඩවැඩියා වර්ග ලෙස සැලකේ. ලෝකයේ උඩවැඩියා පවුලේ ශාක 24000 ක් පමණ ඇතැයි පැවසේ.

පේරාදෙණිය උද්භිද උද්‍යානය තුළ සංචාරකයන්ට අවශ්‍ය මූලික පහසුකම් සපයා ඇතුවාක් පමණක් නොව, ගොණුන් බැඳි කරත්තයෙකින් උද්‍යානය නරඹමින් චාරිකා කිරීමේ අවස්ථාව ද සංචාරකයන්ට උදාකර ගත හැකි ය. ❑